සංඛ්‍යාව සමස්තයක් ලෙස ගත් කල ඉහළ ප්‍රමාණයක් වුව ද, 1980 දී විශේෂයෙන්ම, සංවිධානාත්මක අංශය තුළ රැකියා ඇති කිරීමේ අනුපාතය පැහැදිළි ලෙස අඩු වී ඇත. 1978 හා 1979 අවුරුදුවල දී පිළිවෙලින් 145,000 සහ 115,000 ක් වූ නව සේවා නියුක්ති අවස්ථාවන් සමග සසඳා බලන විට, 1980 දී ආණ්ඩුවේ දෙපාර්තමේන්තු අර්ධ – රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් සංවිධානාත්මක (එනම්, සේවක අර්ථසාධක අරමුදලට දායක වන) පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන ආදිය මගින් සපයන ලද රැකියාවන් ප්‍රමාණය වූයේ 18,035 ක් පමණි. කෙසේ වුව ද, මෙම ප්‍රමාණය තුළ, සංවිධානාත්මක නොවූ පෞද්ගලික අංශයේ සහ සම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ රැකියා අවස්ථා මෙන්ම ආර්ථිකයේ විවිධ අංශවල වැඩිවූ ස්වයං- රැකියා පිළිබඳ සංඛ්‍යාවන්ද ඇතුළත් වන්නේ නැත.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන වාර්ෂික සමීක්ෂණයට අනුව, 1979 දී ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල රැකියා ගණන 33,173 කින් වැඩිවූ අතර, 1980 දී එම ප්‍රමාණය වැඩිවූයේ 6,193 කින් පමණි. අර්ධ රාජ්‍ය සංස්ථාවල, 1979 දී ඇති කරන ලද 68,000 ක් වූ නව රැකියා සංඛ්‍යාව සසඳන විට 1980 දී ඇති කරන ලද නව රැකියා ප්‍රමාණය 8,812 ක් විය. සේවක අර්ථසාධක අරමුදලේ වාර්තා වලින් සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන අතුරෙන් තෝරාගත් කිහිපයකින් යුතු නියැදියක් ආශ්‍රයෙන් ද ලබාගත් තාවකාලික දත්තයන්ට අනුව, සංවිධානාත්මක පෞද්ගලික අංශය තුළ නව සේවා නියුක්ති අවස්ථාවන් 3,030 ක් 1980 දී උත්පාදනය වූ බව පෙනී යයි.

ආර්ථිකයේ ප්‍රධාන අංශවල ශ්‍රමය යොදා ගැනීමේ ධාරිතාවය පොදු වශයෙන් පහළ වැටීම 1980 වර්ෂයේ දී, සේවා නියුක්තිය සාපේක්ෂ ලෙස අඩුවෙන් වර්ධනය වීමට ප්‍රධානතම හේතුව ලෙස සැළකිය හැකිය. උදහරණයක් වශයෙන්, 1980 දී වැවිලි අංශයේ වර්ධන අනුපාතය පහළ මට්ටමක පැවති අතර, ඉදිකිරීම් අංශයේ හා වෙළෙඳ කටයුතුවල ඉහත අවුරුදු දෙක තුළ පැවැති අන්දමේ ඉහළ ක්‍රියාකාරිත්වයක් පවත්වා ගැනීමට ද නොහැකි විය. ආයෝජන වර්ධනය කිරීම සඳහා ප්‍රදානය කරන ලද එක්වර ක්ෂය ප්‍රතිභාග දීමනාව වැනි බදු සානුබල යටතේ කර්මාන්ත අංශය ද පෙරට වඩා ප්‍රාග්ධන සූක්ෂම තාක්ෂණය වෙත නැඹුරු වන්නට ඇත. තවද, ආනයන හා විනිමය ලිහිල් කරණයත් සමගම එළඹි මුල් කාලසීමාව තුළ දී දක්නට ලැබුණු ඉහළ සේවා නියුක්ති වර්ධන අනුපාතය, ආර්ථිකයේ ශ්‍රමය යොදා ගැනීමේ ධාරිතාවය පුළුල් නො කළහොත් නො කඩවාම වසරින් වසර පවතී යයි බලාපොරොත්තු විය නො හැකිය.

## මිල

1976 සහ 1977 යන වර්ෂ වලදී සියයට 1 බැගින් ද, 1978 වර්ෂයේදී සියයට 12 කින් සහ 1979 වර්ෂයේදී සියයට 11 කින් ද, වර්ධනය වූ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය 1980 වර්ෂයේ දී සියයට 26 ක වර්ධනයක් වාර්තා කළේය. තවද 1979 දෙසැම්බර් මාසයට වඩා 1980 දෙසැම්බර් මාසයේදී දර්ශකය සියයට 25 ක වැඩිවීමක් පෙන්වයි. අදාළ මාස සඳහා දර්ශකය 1977 ට වඩා 1978 දී සියයට 17 ක වැඩිවීමක් ද, 1978 ට වඩා 1979 දී සියයට 15 ක වැඩිවීමක් ද පෙන්වීය. මේ අනුව පසුගිය වර්ෂ කිහිපය අතරින් මිල මට්ටමේ වර්ධනයේ වැඩිම වේගය සිදුවී ඇත්තේ 1980 දී බැව් පෙනී යයි.

භාණ්ඩ අනුව විශ්ලේෂණය කිරීමේ දී හෙළිදරව් වනුයේ 1980 වර්ෂය තුළ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ වර්ධනයෙන් සියයට 46 ක් දේශීය භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසාත්, සියයට 52 ක් ආනයනයන්හි මිල වැඩිවීම නිසාත්, ඉතිරි සියයට 2 අපනයන ගණයට අයත් භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසාත් සිදුවී ඇති බවය. තවද, සහල්, තිරිඟු පිටි, පාන්, සීනි, කිරිපිටි, භූමිතෙල් සහ බස් ගාස්තුවල ආරෝහන මිල ප්‍රතිශෝධනයන් නිසා දර්ශකයේ වර්ධනයෙන් සියයට 66 ක් සිදු වූ අතර, ඉතිරි ප්‍රමාණය පාලනයට යටත් නොවූ භාණ්ඩයන්ගේ සිදු වූ මිල වැඩිවීමේ බලපෑම පෙන්විය.

# තොග අලෙවි මිල දර්ශකය

1974 = 100

1975 වාර්ෂික; 1976 සිට මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1980 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ තොග අලෙවි මිල දර්ශකය ද පසුගිය වසරට වඩා සීඝ්‍ර වර්ධනයක් පෙන්විය. 1978 වර්ෂයේදී සියයට 16 කින් ද, 1979 වර්ෂයේ දී සියයට 9 කින් ද, වර්ධනය වූ දර්ශකය 1980 වර්ෂයේ දී සියයට 34 ක වර්ධනයක් පෙන්නුම් කළේය. තොග අලෙවි මිල දර්ශකයේ ඇතිවූ වර්ධනයෙන් සියයට 38 ක සිදුවී ඇත්තේ දේශීය භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසා වන අතර පිළිවෙළින් සියයට 25 ක් සහ සියයට 36 ක් සිදුවී ඇත්තේ අපනයන සහ ආනයන භාණ්ඩයන්ගේ මිල වැඩි වීමෙනි.

තවදුරටත් පැහැදිලි වන්නේ දර්ශකයේ වර්ධනයෙන් සියයට 72 ක් පාරිභෝගික භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසා ද, සියයට 24 ක් අන්තර් භාණ්ඩවල මිල වැඩිවීම නිසා සහ ඉතිරි සියයට 4 ක් ආයෝජන භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසාද සිදුවී ඇති බවය.

පවත්නා මිල ගණන් අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයේත්, 1970 ස්ථාවර මිල ගණන් අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයේත් අනුපාතය වන ගම්‍ය මිල දර්ශකය ද සමාන උපනතියක් පෙන්වමින් 1980 වර්ෂයේ දී සියයට 18 කින් වර්ධනය විය. මීට ඉහත වසර දෙක තුළ දී එය වර්ධනය වී ඇත්තේ සියයට 15 කින් පමණි.

1980 වර්ෂයේ ඇති වූ මිල මට්ටමේ තියුණු වැඩිවීම කරුණු කීපයක සංකලනයකි. මෙයට රුපියල අවප්‍රමාණය කිරීම නිසා ඇති වූ මිල වෙනස්වීම්, වැඩි කරන ලද සමහර බදු ප්‍රමාණයන්, උපයෝජන හා සේවා ගාස්තුවල ආරෝහන ප්‍රතිශෝධනයන්, ඛනිජ තෙල් නිෂ්පාදනයන්ගේ මිල වැඩිවීම, විදේශීය වෙළෙඳපොළවල මිල වැඩිවීම සහ ප්‍රධාන පාරිභෝගික භාණ්ඩයන්ගේ ආරෝහණ මිල ප්‍රතිශෝධනයන් යනාදී පිරිවැය වැඩිවීමට හේතුවන කරුණු ඇතුළත් වේ. ඊට අමතරව රාජ්‍ය වියදමේ සාන්තතික ප්‍රසාරණයන්, සංක්‍රමණික කම්කරුවන් නිසා වැඩි වූ විනිමය ප්‍රේෂණයන් සහ සාන්තතික දේශීය මූල්‍ය ප්‍රසාරණය වැනි ඉල්ලුම වැඩි කිරීමට අඩුදෙන කරුණු ද ඇතුළත් වේ.

එක් වසරක් තුළ සියයට 30 ක වේගයකින් මිල මට්ටම වෙනස්වීම දැඩි සැළකිල්ලට භාජනය කළ යුතු කරුණකි. මේ ප්‍රමාණයෙන් මිල මට්ටමේ වැඩිවීමක් නිසා ව්‍යාපෘති පිරිවැය ගණනය දුෂ්කර කර්තව්‍යයක් වනු ඇත. අනාගතයේදී තවදුරටත් මිල මට්ටමේ වැඩිවීමක් ඇතිවෙතැ'යි සංකල්පනය කිරීමෙන් ප්‍රාග්ධන ව්‍යාපෘතීන් ඇරඹීම පිළිබඳව අහිතකර වාතාවරණයක් ඇතිවීමට ඉඩ තිබේ. මිල මට්ටමේ වැඩිවීමේ උපනති මර්ධනය කිරීම පිණිස උචිත මිල ස්ථාවරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක නො කළහොත් අධිවේග සහ ස්වයංක්‍රීය මිල වැඩිවීමක් සිදුවී සංවර්ධන ප්‍රයත්නයන් අඩාල වීමට ඉඩ ඇත.

## වැටුප්

1980 වර්ෂයේදී රාජ්‍ය සේවකයන්ගේ සහ වේතන මණ්ඩල රෙගුලාසිවලට යටත් වන පුද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් අඩුවිය.

1980 වර්ෂයේ රජයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප්වල වර්ධනය 1979 දී සිදු වූ වර්ධන වේගයට වඩා අඩුවිය. පසුගිය වර්ෂයේදී සියයට 16 කින් වැඩි වූ කාර්මික හා ලිපිකරු සේවකයන්ගේ මූල්‍ය වැටුප් දර්ශකය 1980 දී වැඩිවූයේ සියයට 10 කින් පමණි. මේ අතර සුළු සේවකයන්ගේ සහ පාසල් ගුරුවරුන්ගේ මූල්‍ය වැටුප්වල වැඩිවීම 1979 දී පිළිවෙළින් සියයට 21 ක් සහ සියයට 15 ක්වූ අතර, 1980 වර්ෂයේ දී එය සියයට 12 ක් සහ සියයට 9 ක් විය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප් මෙසේ වැඩිවීමට ප්‍රධානම හේතුව වූයේ 1980 නොවැම්බර් මාසයේ දී වූ රුපියල් 70 ක වැටුප් වැඩි කිරීමයි.

1978 සහ 1979 වසර වල දී සියයට 7 කින් වැඩි වූ රජයේ සේවකයන් සඳහා වන මූර්ත වැටුප් දර්ශකය[1] 1980 වර්ෂයේ දී සියයට 11·6 ක අඩුවීමක් පෙන්විය. එමෙන්ම 1979 වසරේදී සියයට 5 කින් වැඩි වූ කාර්මික සහ ලිපිකරු සේවකයන්ගේ මූර්ත වැටුප් මෙම වසරේදී සියයට 13 කින් අඩුවිය. තව ද පසුගිය වසරේ දී සියයට 9 කින් වැඩි වූ සුළු

1. මූර්ත වැටුප් ගණනය කොට ඇත්තේ මූල්‍ය වැටුප් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් අවධමනය කිරීමෙනි.